www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මිසයිල ආරක්ෂක වැඩ පිලිවෙල සහ තියුනු වන එක්සත් ජනපද-රුසියානු භූ-දේශපාලන ආතති

## The missile defense scheme and the sharpening of US-Russian geopolitical tensions

**විලැඩිමීර් වොල්කොව් විසිනි**
**2008 ජූලි 18**

රේඩාර් හා ප්‍රතිමිසයිල පද්ධති ස්ථාපිත කිරීම සඳහා නැගෙනහිර යුරෝපා චෙක් සමූහාන්ඩුවේ භූමි ප්‍රදේශය යොදා ගැනීම සම්බන්ධයෙන් එක්සත් ජනපදය සහ එම සමූහාන්ඩුව ජූලි 8 වන දා ප්‍රාග් නුවර දී ගිවිසුමකට අත්සන් තැබී ය. මේ ගිවිසුම එක්සත් ජනපදය හා රුසියාව අතර භූදේශපාලනික ආතතීන් තියුනු කරන තවත් පියවරක් බවට පත් වී ඇත. එය රුසියාව වෙතින් ඝෝෂාකාරී ප්‍රතිචාරයක් පැන නැංවී ය.

ඇමරිකානු රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස් සහ චෙක් සමූහාන්ඩුවේ විදේශ කටයුතු පිලිබඳ ඇමති කැරල් ෂ්වාසන්බර්ග් අත්සන් තැබූ මෙම ගිවිසුමට චෙක් පුරවැසියන්ගෙන් සියයට 70ක් පමන දෙනා විරුද්ධත්වය පල කර ඇත. ගිවිසුම ආරක්ෂා කරන්නන් එය යුක්ති සහගත කලේ, ඉරානයෙන් එල්ල විය හැකි මිසයිල ප්‍රහාරයන්ගෙන් යුරෝපය ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාව පෙන්වා දෙමිනි. කෙසේ වුව ද, රුසියානු පාර්ශ්වය අවධාරනය කරන්නේ, නැගෙනහිර යුරෝපය තුල ප්‍රතිමිසයිල ආරක්ෂක පද්ධතියක යටිතල පහසුකම් ගොඩ නැගීමේ සැබෑ ඉලක්කය වන්නේ ඉරානය නො ව රුසියාව බව යි. මේ සැලැස්ම මුදුන් පමුනුවා ගැනුන හොත් රුසියාවේ මිලිටරිමය හා දේශපාලනික තත්ත්වය දුබල වනු ඇත.

ඊලඟ දා රුසියානු විදේශ කටයුතු අමාත්‍යාංශය නිකුත් කල ප්‍රකාශයකින් කියැවුනේ,

"රුසියානු පාර්ශ්වය, එවන් තත්ත්වයක දී, සිය ජාතික ආරක්ෂාවට එල්ල විය හැකි තර්ජනවලට හිලව්වක් වශයෙන් ප්‍රමානවත් පියවර ගන්නා" බව යි. ප්‍රකාශය සඳහන් කලේ "රාජ්‍ය තාන්ත්‍රික විධික්‍රම ගැන නො ව මිලිටරිමය-තාක්ෂනික විධික්‍රම" ගැන යි.

ජූලි 15 වන දා රාජ්‍ය තාන්ත්‍රික නිලධරයන්ගේ නියෝජිතයන් සමග ක්‍රෙම්ලිනයෙහි පැවැත්වූ රැස්වීමක කතා කරමින් රුසියානු ජනාධිපති ද්මිත්‍රි මෙඩ්වෙඩෙව් මෙසේ කියා සිටියේ යඃ

"එක්සත් ජනපදය නැගෙනහිර යුරෝපය තුල ගෝලීය ප්‍රතිමිසයිල පද්ධතියක අංග ස්ථාපනය කරන එකෙන් සිද්ධ වෙන්නෙ තත්ත්වය වඩා බැරෑරුම් අතට හැරෙන එක විතර යි, එතකොට අපට බල කෙරේවි සුදුසු විදියට මේකට ප්‍රතිචාර දක්වන්න."

සිය හවුල්කරුවන්ගේ යහපත් වචනවලින් පමනක් රුසියාවේ ජාතික ආරක්ෂාව පවත්වා ගෙන යා නොහැකි වනු ඇතැයි ප්‍රකාශ කල ඔහු, "අපේ රටවල් අතර සබඳතාවල පවතින මූලෝපායාත්මක ස්ථාවර භාවයට... ක්‍රමානුකූලව වල කැපීම" ගැන වොෂින්ටනයට චෝදනා කලේ ය.

නැගෙනහිර යුරෝපය තුල ඇමරිකානු ප්‍රතිමිසයිල පද්ධතියක අංග ස්ථාපිත කිරීමේ ක්‍රියා දාමයට, චෙක් සමූහාන්ඩුව තුල රේඩාර් පද්ධතියක් ස්ථානගත කිරීමට අමතරව පෝලන්ත භූමි ප්‍රදේශයෙහි ප්‍රතිමිසයිල රොකට්ටු දස ගනනක් ස්ථානගත කිරීම ද ඇතුලත් ය. කෙසේ වුව ද, පෝලන්ත ආන්ඩුව කොන්දේසි ගනනාවක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එක්සත් ජනපදය සහ වෝර්සෝව අතර සාකච්ඡා නැවතී ඇත. ඒ අතර පැවති ප්‍රධාන කොන්දේසිය වූයේ, පෝලන්ත හමුදාව සහ ගුවන් ආරක්ෂක උපක්‍රම නවීකරනය කිරීමට ආධාර වශයෙන් ඩොලර් බිලියන 20ක් ලබා දෙන ලෙස කෙරුනු ඉල්ලීම යි.

පෝලන්ත අගමැති ඩොනල්ඩ් ටස්ක්ගේ අදහස අනුව, ප්‍රතිමිසයිල පද්ධතියක ස්ථාපනය කිරීමෙන් එක්සත් ජනපදයේ ආරක්ෂාව වැඩි දියුනු වෙතත් පෝලන්තයේ ආරක්ෂාව වැඩි දියුනු නො වේ. "එක්සත් ජනපදයත් එක්ක පෝලන්තය පවත්වන සාකච්ඡාවල ප්‍රධාන ප්‍රශ්නය වෙලා තියෙන්නෙ, දේශපාලනික සහතික වීම් මගින් වගේ ම නිශ්චිත මිලිටරිමය සහතික වීම් මගිනුත්, පෝලන්තයේ ආරක්ෂාව වැඩි දියුනු කර ගන්න එක" යි ඔහු කියා සිටියේ ය.

පෝලන්ත නායකයන්ගෙන් එල්ල වූ විරුද්ධත්වයට මුහුන පෑමෙන් අනතුරුව, එක්සත් ජනපදය ලිතුවේනියානු ආන්ඩුව සමග ප්‍රතිමිසයිල රොකට්ටු ස්ථාපනය කිරීම පිලිබඳ මූලික සාකච්ඡා ආරම්භ කලේ ය. කෙසේ වුව ද, එමගින් මොස්කෝවෙන් වඩා කෝපාවිෂ්ඨ ප්‍රතිචාරයක් ඇවිස්සෙන්නට ඉඩ තිබෙන නිසා, අනෙකුත් හේතු කාරනා අතර ම, මෙම වෙනස්

වීම වැඩි වශයෙන් ම සිදු වී ඇත්තේ වෝර්සෝවට පීඩනය යෙදීමේ ක්‍රමයක් ලෙස බව පෙනී යයි.

රුසියාව ගැනීමට බලාපොරොත්තු වන "සුදුසු පියවරයන්" අතරට ඇතුලත් වන්නේ, කලිනින්ග්‍රෑඩ් ප්‍රදේශය තුල නූතන ස්ථානගත කිරීම හා ඇමරිකානු ප්‍රතිමිසයිල ආරක්ෂක වැඩ පිලිවෙලට අයත් අංග ස්ථානගත කෙරෙන ප්‍රදේශ දෙසට සිය න්‍යෂ්ටික මිසයිල ප්‍රතිඉලක්කගත කිරීම යි.

කලිනින්ග්‍රෑඩ් ප්‍රදේශය තුල ලඟ දී ම න්‍යෂ්ටික යුද ශීර්ෂ සහිත රුසියානු ප්‍රක්ෂේපී මිසයිල ස්ථානගත කරන්නට යන බව වාර්තා කරමින් සිය මොස්කව් වාර්තාකරු වන මාක් ෆ්‍රැන්ෂෙට් ලියූ ලිපියක් අප්‍රේල් 14 වන දා ලන්ඩනයේ ටයිම්ස් පුවත්පතේ පල විය. ෆ්‍රැන්ෂෙට් රුසියානු ආරක්ෂක සංස්ථාපිතය තුල මූලාශ්‍රයක් උපුටා දැක්වී ය.

මෙබඳු සැලසුම් සැබැවක් විය හැකි ය. ඊට හේතුව නම්, ඒවා මෑත දී රුසියානු පාලන තන්ත්‍රයේ නියෝජිතයන් විසින් සිදු කරන ලද ප්‍රකාශවල තර්කනයට මුලුමනින් ම අනුරූප වීම යි.

එක්සත් ජනපදයෙන් එල්ල වන මිලිටරිමය තර්ජන වැලැක්වීම සඳහා කලිනින්ග්‍රෑඩ්හි නව මිසයිල බල කඳවුරක් වර්ධනය කිරීමට රුසියාව සූදානමින් සිටින බව පසු ගිය වසරේ පලමු උපඅගමැති සර්ජි ඉවානොව් කියා සිටියේ ය. එමෙන් ම, ඇමරිකාවේ ප්‍රතිමිසයිල සැලසුම්වලට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් රුසියාව මධ්‍යම හා සුලු පරාස මිසයිල ඇවර කිරීම පිලිබඳ ගිවිසුමෙන් ඉවත් වන බවට අන දෙන නිලධාරීන්ගේ මන්ඩලයේ හිටපු ප්‍රධානයා වන යූරි බාලොව්ස්කි ප්‍රතිඥා දුන්නේ ය.

ප්‍රාග් නුවර දී ගිවිසුම අත්සන් කිරීම කෙරෙහි දැක්වූ ක්ෂනික රාජ්‍ය තාන්ත්‍රික ප්‍රතිචාරයක් වශයෙන්, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය හමුවේ ඉදිරිපත් වූ කෙටුම්පත් යෝජනාවකට විරුද්ධව ජූලි 11 වන දා රුසියාව චීනය සමග එක්ව නිෂේධ බලය පාවිච්චි කලේ ය. යෝජනාවේ ඇතුලත්ව තිබුනේ මර්දනය යොදා ගැනීම සම්බන්ධයෙන් සිම්බාබ්වේ නායකයන්ට එරෙහිව පැනවිය යුතු සම්බාධක පිලිබඳව යි. සම්බාධක පැනවීමෙන් බලාපොරොත්තු වූයේ ජනාධිපති රොබට් මුගාබේ මැතිවරනයට ඉදිරිපත් වීම වැලැක්වීම යි.

මේ නිෂේධ බලය පාවිච්චි කිරීමේ සිද්ධියට දින කීපයකට පෙර, ටෝකියෝ නුවර පැවති ලෝක නායකයන්ගේ රැස්වීමකට සහභාගි වී සිටින අතරතුර දී, සිම්බාබ්වේ රාජ්‍යය සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමට යන යෝජනාවක් පිලිගන්නා ලෙස කෙරුනු යෝජනාවකට ද්මිත්‍රි මෙඩ්වෙඩෙව් සහාය පල කලේ ය. රුසියාව තමන් ගත් ආස්ථානය කඩිමුඩියේ වෙනස් කිරීම බටහිර රටවල් විසින් දැක ගන්නා ලද්දේ, එය "ජී-8" කන්ඩායමේ සාමාජිකයෙකු ලෙස "විශ්වසනීය නොවන බව" පෙන්නුම් කරන සාක්ෂ්‍යයක් වශයෙනි.

රුසියාව දැක්වූ තවත් ප්‍රතිචාරයක් වූයේ චෙක් සමූහාන්ඩුවට ආර්ථිකමය වශයෙන් "දඬුවම් පැමිනවීමට" ගත් තීරනය යි. ජූලි 8 වන දා, "මිත්‍රත්ව" නල මාර්ගය හරහා චෙක් සමූහාන්ඩුවට කෙරෙන තෙල් සැපයුම අඩකින් කපා හරින ලදි. මෙම සැපයුම අඩු කිරීම ප්‍රගාඪ ආර්ථිකමය සලකා බැලීම් මත සිදු වූවක් යැයි නිල වශයෙන් පැවසුනු නමුත්, මෙම තීන්දුවත් චෙක් සමූහාන්ඩුව තුල රේඩාර් පද්ධතියක් ස්ථාපනය කිරීම පිලිබඳ කාරනාවත් අතර ඍජු සම්බන්ධයක් පවතින බව රුසියානු මාධ්‍ය සැකයකින් තොරව පෙන්වා දුන්නේ ය.

සිය අසල්වාසීන්ට හා හවුල්කරුවන්ට පීඩනය යෙදීම සඳහා රුසියානු පාලන තන්ත්‍රය "ආර්ථික ආයුධය" යොදා ගත් පලමු වතාව මෙය නො වේ.

2005 මුල් දින කීපය තුල දී, යුක්රේනයට ලබා දෙන ගෑස් සැපයුම දින කීපයකට නවතා දැමුනි; බෙලෝරුසියාවට එරෙහිව ද ඒ හා සමාන තර්ජනයන් එල්ල කෙරුනි. 2006 වසන්තයේ දී, මෝල්දාවියානු හා ජෝර්ජියානු ආර්ථිකයන්ට පීඩාකාරී බලපෑම් ඇති කරමින් එම රටවල නිපදවනු ලබන වයින් රුසියාවට ආනයනය කිරීම වැලැක්වෙන තහනමක් පැනවුනි.

2006 ගිම්හානයේ දී, රුසියාව ලිතුවේනියාවෙහි පිහිටි මසියිකියායිස්කි තෙල් පිරිපහදුවට කෙරෙන සැපයුම් නවතා දැමී ය. මෙය සිදු වූයේ, පිරිපහදුව පෞද්ගලීකරනය කිරීමේ හා එහි කොටස් පැවරීමේ තරගයේ දී ජයග්‍රාහකයා වී ඇත්තේ රුසියානු තෙල් සමාගම් නො ව පීකේඑන් ඔර්ලින් නමැති පෝලන්ත තෙල් සමාගම යැයි විල්නියස් ප්‍රකාශ කිරීමෙන් අනතුරුව ය.

චෙක් සමූහාන්ඩුවට රුසියානු තෙල් අපනයනය කිරීම වර්තමානයේ දී තාවකාලිකව නවතා දමා තිබීම එම රට තුල දැවැන්ත උත්සුකතාවක් නිර්මානය වීමට හේතු වී තිබේ. ඉන්ධන තෙල් හිඟයක් හෝ මිල ඉහල යාමක් ඇති වීමට තමන් ඉඩ නොදෙන බවට යුනිපෙට්‍රල් ඒඑස් නමැති චෙක් සමූහාන්ඩුවේ ප්‍රධාන තෙල් පිරිපහදු සමාගම ප්‍රතිඥා දුන්නේ ය. මූලෝපායාත්මක සංචිත යොදා ගැනෙනු ඇති අතර, ජර්මනියේ සිට එන නල මාර්ගයක් මගින් තවත් තෙල් සැපයෙනු ඇත. කෙසේ වුව ද, රුසියානු "අවහිර කිරීම" දිගින් දිගට ම පැවතුන හොත්, චෙක් සමූහාන්ඩුවේ ආර්ථිකයට අවශ්‍ය පෙට්රෝලියම් නිෂ්පාදන සැපයීම සම්බන්ධයෙන් බැරෑරුම් දුෂ්කරතා ඇති වන්නට ඉඩ තිබේ.

## නේටෝව නැගෙනහිරට ව්‍යාප්ත වීම

කෙසේ වුව ද, මේ එක් පියවරකට වත් ඇමරිකානු පාලක ප්‍රභූවේ මූලෝපායාත්මක අවශ්‍යතා මත පදනම්ව තිබෙන එක්සත් ජනපද සැලසුම් මුදුන්පත් වීම වැලකිය නොහැකි ය. එම අවශ්‍යතා මගින් ඉල්ලා සිටිනු ලබන්නේ, ලෝක වෙලඳ පොලට බලශක්ති සම්පත් සැපයෙන අතිවැදගත් සැපයුම් මාර්ග මත තමන්ට පවතින පාලනය වඩ වඩාත් වැඩි කිරීම සහ නැගෙනහිර යුරෝපය හා පැවති සෝවියට් සංගමයට අයත් වූ ප්‍රදේශය තුල තමන්ගේ භූදේශපාලනික ආනුභාවය වඩ වඩාත් පැතිරවීම යි.

1991 දී සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය බිඳ වැටුනු තැන් සිට, දැවැන්ත මෙන් ම කලින් ප්‍රවේශ විය නොහැකිව තිබුනු මේ ප්‍රදේශය තුල එක්සත් ජනපදය සිය තත්ත්වය අඛන්ඩව ශක්තිමත් කර ගෙන තිබේ. විශේෂයෙන් ම, 2001 සැප්තැම්බර් 11 දා සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාරවලින් අනතුරුව මෙම ක්‍රියා දාමය වේගවත් කෙරින. සිය බලය ව්‍යාප්ත කර ගැනීම සඳහා දිගු කලක් තිස්සේ පැවති සැලසුම් මුදුන් පමුනුවා ගැනීමට ඇමරිකානු අධිරාජ්‍යවාදය එම ප්‍රහාර කඩතුරාවක් ලෙස යොදා ගත්තේ ය.

කිර්ගිස්ථානයෙහි හා උස්බෙකිස්ථානයෙහි මිලිටරි කඳවුරු ස්ථාපනය කෙරින (2005 වසන්තයේ දී අනිෂාන්හි පැන නැගි විරෝධතා රැල්ලට එරෙහිව ඉස්ලාම් කරිමොව් ආන්ඩුව එල්ල කල ප්‍රහාර බටහිර රටවල් විසින් හෙලා දකිනු ලැබීමෙන් පසුව උස්බෙකිස්ථානයෙහි කඳවුර වසා දමන ලදි).

2004 දී, බෝල්ටික් සමූහාණ්ඩු තුන නේටෝවේ සාමාජිකයන් බවට පත් විය.

"වර්න විප්ලවවල" ප්‍රතිඵලයක් ලෙස (2003 ශරදයේ දී) ජෝර්ජියාවෙහි ද (2004 ශරදයේ දී) යුක්රේනයෙහි ද ඇමරිකානු හිතවාදී ආන්ඩු බලයට පත් විය.

මේ වසරේ වසන්තයෙහි බුකාරෙස්ට් නුවර පැවති නේටෝ සමුලුවේ දී, සාමාජිකත්ව ක්‍රියාකාරී සැලැස්මට (ඒැපඉැරියසච 'ජඑසදබ ඡක්බ - එම්ඒපී) ජෝර්ජියාව හා යුක්රේනය එක් කර ගැනීම පිලිබඳ සාකච්ඡාවක් පැවතුනි. එම තීන්දුව නොගැනුනි. කෙසේ වෙතත්, අඩු ගනනේ ජෝර්ජියාව සම්බන්ධයෙන්, පසු ගිය සතියේ ටිබිලිසි වෙත කල සංචාරයේ දී රාජ්‍ය ලේකම් රයිස් කියා සිටියේ, මේ වසරේ දෙසැම්බරයේ දී " ජෝර්ජියාව එම්ඒපීයට එක් කර ගැනීමේ අදහස මුදුන් පමුනුවා ගන්න එක්සත් ජනපදය උත්සාහ කරනු ඇත" යන්න යි.

අවසානයේ, ජූනි මස අග දී, අසර්බයිජානය නේටෝවට ඇතුලත් කර ගැනීම පිලිබඳ ප්‍රශ්නය පැන නැගින. අසර්බයිජානයෙහි එක්සත් ජනපද තානාපති ඈන් ඩර්සි ප්‍රකාශයට පත් කලේ එම ඉදිරිදර්ශනය යි. "අසර්බයිජානය නේටෝවට එක් කර ගැනීම පිලිබඳ ප්‍රශ්නයේ දී මැදිහත්කරුවෙකු විදියට ක්‍රියා කරන්න තුර්කිය සූදානම්" යැයි කී අසර්බයිජානයෙහි තුර්කි තානාපති බුලුසි කිල්ජිගෙන් ඩර්සිගේ කතාවට සහාය ලැබුනි.

## රුසියාවේ මිලිටරිමය සහ දේශපාලනික මතවාදය

වඩා ස්වාධීන හා ආක්‍රමනකාරී ස්ථාවරයක් තෝරා ගැනීම උදෙසා රුසියානු රාජ්‍ය තාන්ත්‍රික හා මිලිටරිමය පිලිවෙතෙහි සැලකිය යුතු සංශෝධන සිදු කරන බව ප්‍රකාශයට පත් කරන්නට, එක්සත් ජනපද භූදේශපාලනික ආක්‍රමනකාරිත්වය මගින් ක්‍රෙම්ලිනයට බල කරනු ලැබ ඇත.

මෙහි ලා සන්ධිස්ථානයක් වූයේ 2007 පෙබරවාරියෙහි මියුනිච් නුවර දී ව්ලැඩිමිර් පුටින් කල කතාව යි. "නොනැවතී වර්ධනය වන ආකාරයකින් ජාත්‍යන්තර නීතියේ මූලික මූලධර්ම නො තකා හැරීම" සම්බන්ධයෙන් එක්සත් ජනපදය හෙලා දුටු ඔහු, " ජාත්‍යන්තර සබඳතාවල දී නොහික්මුනු හා පමන ඉක්මවූ ආකාරයෙන් බලය යොදා ගැනීමට, එනම් එක් ගැටුමකට පසු තවත් ගැටුමක ලෝකය ගිල්වමින් මිලිටරිමය බලය යොදා ගැනීමට" එරෙහිව කතා කලේ ය.

මෙම හෙලා දැකීමෙහි පැහැදිලි කුහකත්වයක් ගැබ් වී තිබුන ද (දුබල වුව, රුසියානු පාලක ප්‍රභූවේ හැසිරීම වොෂින්ටනයේ ක්‍රියාවන්ගේ ම දර්පන පිලිබිඹුවකි) එහි හරය සැලකිල්ලට ගත් විට එය මුලුමනින් ම යුක්ති සහගත ය.

මෙම තීරනාත්මක සංසිද්ධියෙහි ප්‍රතිවිපාක ලඟා වන්නට වැඩි කලක් ගත වූයේ නො වේ:

* 2007 අගෝස්තුවේ දී, 15 වසරක කාලයක් තුල ප්‍රථම වතාවට, මූලෝපායාත්මක න්‍යෂ්ටික අවි දරා ගත් රුසියානු ටියූ-160 හා ටියූ 95 බෝම්බ ප්‍රහාරක යානා බ්‍රිතාන්‍ය දේශ සීමා තෙක් පියාසර කරමින් ගුවනෙහි මුර සංචාර ආරම්භ කලේ ය;

* ගිම්හානයේ දී ෂැංහයි සහයෝගිතා සංවිධානයේ (එස්සීඕ) රටවල් සමග එක් වී මිලිටරි අභ්‍යාස සිදු කෙරුනි. හෙලිකොප්ටර සහ ගුවන් යානා ද සහිතව චීන සන්නාහ සන්නද්ධ හමුදා භටයෝ 1,770 දෙනෙක් ප්‍රථම වතාවට රුසියානු භූමි ප්‍රදේශයෙට (දකුනු යූරල් ප්‍රදේශයෙහි) ගොඩබස්වන ලදි;

* වසර අවසානයෙහි, සිය න්‍යෂ්ටික වැඩ සටහන අඛන්ඩව පවත්වා ගෙන යාමට ටෙහෙරානයට අවස්ථාව සලසා දෙමින් රුසියාව යලිත් ඉරානයේ බුෂෙහ්ර් න්‍යෂ්ටික වැඩපොලට න්‍යෂ්ටික ඉන්ධන සැපයීම ආරම්භ කලේ ය;

* 2007 දෙසැම්බරයේ දී, යුරෝපයෙහි සම්ප්‍රදායික සේනාංක (සීඑෆ්ඊ) පිලිබඳ ගිවිසුමට තාවකාලික විරාමයක් තැබින. යුරෝපයට මායිම් වන රටේ බටහිර කලාප තුල සිය මිලිටරි සේනාංක වැඩි කර ගැනීමට එමගින් රුසියාවට අවස්ථාව සැලසුනි.

"සමීප පිටරටවල" අසල්වැසියන් සමග රුසියාවට පවතින සබඳතා වඩ වඩා ආක්‍රමනකාරී වන්නට පටන් ගෙන තිබේ. රුසියානු විදේශ පිලිවෙත සැලසුම් කරන්නන් අතර සිටින ආනුභාව සම්පන්නයෙකු වන සර්ජි කරගානොව්, *යථා දේශපාලනය* යන මේ පැරනි අධිරාජ්‍ය සම්ප්‍රදාය යලි උපත ලැබීම පිලිබඳව 2006 මැයි 5 වන දා ආන්ඩුවේ *රෂියන් ගැසට්* පත්‍රයෙහි මෙසේ පහදා දුන්නේ යː "අපගේ දේශ සීමාවෙහි වෙනත් ජාතීන්ට නො ව අපට මිතුරු රටවලින් සැදුනු බඵරයක් පවත්වා ගෙන යාමට අපට ඇති අයිතිය ප්‍රදර්ශනය කරන්නට අපට පුලුවන; අප එය ප්‍රදර්ශනය කල යුතු ය."

රුසියාවේ වර්තමාන මිලිටරි මතවාදය න්‍යෂ්ටික අවි යොදා ගැනීම සඳහා අවසර ලැබෙන්නේ ප්‍රහාරයකට ප්‍රතිචාර දැක්වීමේ දී පමනක් ය යන ආස්ථානයෙන් ගලා ආවත් මිලිටරි අන දෙන නිලධරයේ ප්‍රධාන නියෝජිතයෝ ප්‍රහාරයක් කල් තියා වලක්වනු පිනිස ඒවා යොදා ගැනීමට හැකියාවක් නැද්ද යන ප්‍රශ්නය මතු කරමින් සිටිති.

රුසියානු ෆෙඩරේෂනයේ අන දෙන නිලධාරීන්ගේ මන්ඩලයේ හිටපු ප්‍රධානයා වන යූරි බාලොව්ස්කි මේ වසරේ ජනවාරියෙහි මොස්කෝවේ දී කියා සිටියේ මෙය යිː "රුසියානු ෆෙඩරේෂනයේ හා එහි මිත්‍රපාක්ෂිකයන්ගේ ස්වෛරී භාවය හා භෞමික අඛන්ඩතාව ආරක්ෂා කරනු පිනිස, ප්‍රහාර කල් තියා වැලැක්වීමේ ආකාරය ඇතුලත්ව, රුසියානු ෆෙඩරේෂනයේ මතවාදය පිලිබඳ ලියවිලි තුල නියම කොට ගෙන ඇති අවස්ථාවල දී න්‍යෂ්ටික අවි යොදා ගැනීම ද ඇතුලුව, සන්නද්ධ බලය යොදා ගැනෙනු ඇත."

භූදේශපාලනික ගැටලු පිලිබඳ අධ්‍යයන ආයතනයේ ප්‍රධානයා වන ජනරාල් ලියොනිඩ් ඉවාෂොව්ගේ අදහස අනුව, ජාතික ආරක්ෂාව යනු "රුසියාවේ ප්‍රධාන ජාතික ව්‍යාපෘතිය" යි. එක්සත් ජනපදය සහ නේටෝව සම්බන්ධයෙන් දැඩි මතධාරියෙකු ලෙස කතා කරමින්, 2008 ජූනි 6 වන දා *ඉන්ඩිපෙන්ඩන්ට් ගැසට්* පත්‍රයෙහි ඔහු මෙසේ ලිවී යː

"ලෝකය මිලිටරීකරනය වෙමින් පවතින අතර, හයිඩ්‍රොකාබන ගෝලීය ගැටුම්වල ප්‍රධාන විෂය බවට පත් වී තිබේ; ඒවා අයිති කර ගැනීම සඳහා කරන අරගලයේ දී, න්‍යෂ්ටික අවි දක්වා වූ සකලවිධ මාධ්‍ය පුලුල් පරිමානව යොදා ගැනීමට බටහිර රටවල් සූදානම්ව සිටියි. හයිඩ්‍රොකාබනවල හා අනෙකුත් සම්පත්වල මූලාශ්‍රයක් ලෙස ගත් විට, රුසියාව යනු ලෝකය අලුතින් බෙදීමේ ක්‍රියා දාමයෙහි ප්‍රධාන විෂයකි. රුසියාවට එල්ල කෙරෙන ප්‍රහාරයකට එරෙහිව පවතින එක් නිවාරක අංගයක් වන්නේ සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයේ න්‍යෂ්ටික ශක්තියෙන් ඉතිරිපහදු වී ඇති දෙය යි."

සිය අවශ්‍යතා ආරක්ෂා කර ගැනීම සඳහා කොතරම් විනාශකාරී වූ හා ව්‍යසනකාරී වූ ක්‍රියා පිලිවෙතක් වුව ද යොදා ගැනීමට රුසියාවේ පාලක ප්‍රභුවට පවත්නා අධිෂ්ඨානය සිය වචනවලින් පෙන්නුම් කරමින් ඔහු මෙසේ අවධාරනය කලේ යː "නව අවි තරගයක්, සීතල යුද්ධයක් සිදු වෙමින් පවතී, පෙනී යන පරිදි, මානව වර්ගයා බරුරුම් ලෙස 'උනුසුම්' යුද්ධයකට සූදානම් වෙමින් සිටී."

© www.wsws.org